# ප්‍රංශය සහ රෝන් ඇල්ප්ස් ප්‍රාන්තය.

හැඳින්වීම.................

ලෝකයේ ප්‍රධාන පෙලේ දේශපාලන හා ආර්ථික ශක්තීන් පිළිබඳව සලකා බලන විට ප්‍රංශය කාර්මික කරණයට ලක්වූ රටවල් අතරින් ප්‍රධාන තැනක් ගනී. එමෙන්ම, යුරෝපයේ විශාල ප්‍රදේශයක ප්‍රංශය ව්‍යාප්ත වී ඇති අතර, ප්‍රංශය ගෝලීයකරණයට සිය පූර්ණ සහාය දක්වයි. එමෙන්ම සිය ජාතිකත්වය රැකගැනීමට කටයුතු කරන ප්‍රංශය ආර්ථික කටයුතු ඉතා පැහැදිලිව සිදුකරනු ලබයි. ගෝලීයකරණය හා යුරෝපාකරයේ ප්‍රධාන පෙලේ ප්‍රබලයෙකු ලෙස ප්‍රංශය හැඳින්විය හැකිය. ඓතිහාසික කරුණු සලකා බලන කල ප්‍රංශය දේශපාලන ක්ෂේත්‍රයේ මෙන්ම ආර්ථික කටයුතුවලදී ප්‍රබල දායකත්වයක් දක්වා තිබේ. එය වත්මන් ලෝකයටද එකසේ බලපායි. විශේෂයෙන් සව ශක්තියෙන් නැගී සිටීම, මානව අයිතිවාසිකම් හා ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට ගරුකිරීම කළාපීය ජාත්‍යන්තර සහයෝගීතාව ව්‍යාප්ත කිරීම ප්‍රංශය සිදු කරන අතර එය සිය ස්වාධීනත්වය රැකගනිමින් කටයුතු කරන රාජ්‍යයකි. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ ස්ථිර සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ප්‍රංශය එහි සෑම කර්තව්‍යක් සඳහාම සිය සහාය දක්වයි. සංවර්ධන කටයුතු , මානුෂ්‍යවාදී කටයුතු මෙන්ම සාමය රැකීම සඳහා සිදුකරන ලෝක ව්‍යාප්ත වැඩසටහන් සඳහා සහාය දක්වයි. ප්‍රංශය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අයවැය සඳහා මූල්‍ය සහාය ලබාදෙන සිව්වැනි අනුග්‍රාහකයා වෙයි. යුරෝ බිලියන 68.85 ක් 2001 වසරේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයට ප්‍රංශය ලබා දී ඇති අතර, එම සංවිධානයේ විශේෂ ආයතනයක් වෙනුවෙන් තවත් යුරෝ බිලියන 125.55 ලබා දී ඇත. විද්‍යා තාක්ෂණ හා අධ්‍යාපනය, ප්‍රංශයේ සෑම ප්‍රාන්තයකම ව්‍යාප්ත කර ඇති අතර, එම ක්ෂේත්‍රයේ සහාය ලෝකයේ රටවල් රැසකට ලබාදී තිබේ. විශේෂයෙන් අදාල ක්ෂේත්‍රයේ තොරතුරු රැස් කිරීම හා පර්යේශණ සඳහා ප්‍රංශය සහාය දක්වයි. රටවල් 91 පුරා ප්‍රංශ සංස්කෘතික

මධ්‍යස්ථාන 224 ක් පිහිටවා ඇති අතර, ඇලයන්ස්, ප්‍රැන්වයිසස් හෙවත් ප්‍රංශ සහභාගීත්ව ආයතන 263 ක් ලෝ පුරා පිහිටුවා ඇත්තේ ප්‍රංශ භාෂා අධ්‍යාපනය ව්‍යාප්ත කිරීමටයි. ගෝලීයකරණ ඒකාබද්ධතා වැඩසටහන් හා සහයෝගීත්වය සඳහා ප්‍රංශය කටයුතු කරයි. මේ වන විටත් ප්‍රංශ ජාතිකයන් 1774200 ක් ලොවේ විවිධ රටවල මෙම කටයුතු සිදු කරමින් සිටිති. ආසියාව හා ඕෂනියා කලාපය, අප්‍රිකාව හා මැදපෙරදිග , ඇමරිකාව හා යුරෝපය යන ප්‍රදේශවල මෙම පිරිස් ස්ථානගතවී සිටිති. ප්‍රංශය 2003 වසරේ පළමු කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සියයට 1.2 ක් විය. වෙළඳ ආනයනය ඩොලර් බිලියන 27.3 ක්. 2002 වසරේදී එරටින් වාර්තාවී ඇත. ප්‍රංශය ලොවේ ආර්ථික ශක්තිය තුළින් සිව්වෙනි බලසම්පන්න රටවේ. එරට ආර්ථිකයේ කෘෂිකර්මාන්තය සඳහා වැදගත් ස්ථානයක් හිමි වී තිබේ. රටේ ඉඩම්වලින් සියයට 60 ක් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදවා ඇත. ධාන්‍ය, වයින්, කිරි ප්‍රධාන නිෂ්පාදනයන් වන අතර සත්ව නිෂ්පාදන අපනයනයෙන් ලොවේ දෙවන අපනයනකරු බවට ප්‍රංශය පත්වී ඇත. දැනට ලැබී ඇති දත්ත අනුව ධාන්‍ය ටොන් මිලියන 66 ක්, කිරි ලීටර් මිලියන 23 ක්, වයින් හෙක්ටෝ ලීටර් මිලියන 54 ක්, ප්‍රංශය වාර්ෂකව නිෂ්පාදනය කරනු ලබයි. එමෙන්ම, දක්ෂතාවයන්ගෙන් පිරිපුන් මිනිස් සම්පතක් ප්‍රංශයට හිමි වි ඇති අතර විද්‍යාව, තාක්ෂණය හා නව සොයාගැනිම්, පර්යේෂණ හා සංවර්ධන කටයුතු අතින් ප්‍රංශය ලෝකයේ ප්‍රමුඛ ස්ථානයකට පත්වි තිබේ. එමෙන්ම, කාර්මික ප්‍රවර්ධනය අතින් ලොව ප්‍රධාන පෙළේ රටක් බවට ද ප්‍රංශය පත්වි ඇත. සිවිල් ඉංජිනේරු හා ඉදිකිරීමේ කටයතුවලින් වාර්ෂිකව යුරෝ බිලියන 93.15 ක් ප්‍රංශය උපදවා ගනී. කෘෂිකර්ම ක්ෂේත්‍රය හා ආහාර නිෂ්පාදනය ක්ෂේත්‍රයේ වාර්ෂික ආදායම යුරෝ මිලියන 119.9 කි. එම ක්ෂේත්‍රය තුළ පුද්ගලයන් තුන්ලක්ෂ 98 දහසක් සේවය කරති. රසායනික කර්මාන්තයේ පුද්ගලයන් 236500 ක් සේවය කරන අතර ඉන් වාර්ෂිකව යුරෝ බිලියන 70.12 ක් ප්‍රංශයට ලැබේ. ඖෂධ නිෂ්පාදනයෙන් වාර්ෂිකව යුරෝ බිලියන 28.4 ක් උපදවාගන්නා අතර එම ක්ෂේත්‍රයේ පුද්ගලයන් 94500 ක් සේවය කරති. විලාසිතා හා සුබෝපභෝගී භාණ්ඩ නිෂ්පාදනය

වෙනුවෙන් වාර්ෂිකව යුරෝ බිලියන 31.4 ක් උත්පාදනය කෙරෙන අතර. එහි සේවයකරන සේවක සංඛ්‍යාව 222000 කි. ප්‍රංශයේ යටිතල පහසුකම් සැපයීම, කාර්මිකසේවා අංශය ඉතා දියුණුවක් ලබා තිබේ. එය කලාපිය හා ජාත්‍යන්තර වෙළඳාමේදි මෙම කටයුතු ව්‍යාප්ත කර තිබේ. රටතුළ ඉතාමත් වැඩිදියුණුකර මාර්ග , දුම්රිය ප්‍රවාහණ , ගුවන් හා නාවික සේවා පද්ධතියක් තිබේ. විදුලි සංදේශ ක්ෂේත්‍ර සිඝ්‍ර වශයෙන් දියුණු කර ඇති අතර එමගින් ප්‍රවාහන සහ සැපයුම් ක්ෂේත්‍ර සඳහා කාර්යක්ෂම හා විශ්වාසවන්ත සේවාවක් සැපයේ. එමෙන්ම, අප්‍රිකාව, මැදපෙරදිග, දකුණු හා නැගෙනහිර ආසියාව වැනි කලාපවල පිහිටි රටවල් සමග ද්විපාර්ශවික ගිවිසුම් සඳහා ප්‍රංශය එළඹ සිටී. තාක්ෂණික විශේෂඥ සේවා සැපයීම පිළිබඳව වැඩි වශයෙන් මෙම ගිවිසුම්වල එළඹී තිබේ. ලෝකයේ කර්මාන්ත හා තාක්ෂණික සේවා සැපයිමේ දෙවන ස්ථානයට ප්‍රංශය අද පත්ව සිටී.

සංචාරක ක්ෂේත්‍රයේද ප්‍රංශ ආර්ථිකයේ ප්‍රවර්ධනයට දැඩි ලෙස බලපා තිබේ. ලෝකේ රටවල් ගණාවකින් වාර්ෂිකව මිලියන 77කට අධික සංචාරකයින් පිරිසක් ප්‍රංශයට ඇදි එනබව එරට සංචාරක දත්ත අනාවරණය කරයි. ප්‍රංශය තුළ කලාව , සංස්කෘතිය, සංගීතය, මෙන්ම ආහාර හා විලාසිතා සඳහා සමාජයේ වැඩි ස්ථානයක් හිමිවී තිබේ. එය සංචාරකයන්ගේ සිත් ඇදගන්නා අංශබවට පත්ව ඇතැයි ප්‍රංශය සඳහන් කරයි. ප්‍රංශයේ මෙට්‍රොපොලිස් වැනි ස්ථාන සංචාරකයින්ගේ පාරාදීසයක් බවට පත්ව තිබේ. ලෝකයේ සංචාරක කර්මාන්ත අතින් ප්‍රථම ස්ථානයට පත්ව ඇත්තේ ඇමරිකාවයි. ඉතාලිය දෙවන ස්ථානයට පත්ව තිබේ. තුන්වන ස්ථානයට පත්ව ඇත්තේ ප්‍රංශයයි. ඒ අනුව, වාර්ෂිකව යුරෝ බිලියන 25.6 ක ආදායමක් ප්‍රංශය සංචාරක ක්ෂේත්‍රය තුළින් උපදවා ගනී.

ප්‍රංශ යුරෝපා ප්‍රජාවේ සාමාජියෙකුද වෙයි. 1951 දි යුරෝපා ප්‍රජාවට ඇතුළත් විමේ ගිවිසුම ප්‍රංශය අත්සන් තැබුවේ පැරිසියේදීය. ජර්මනිය , ප්‍රංශය, බෙල්ජියම, ඉතාලිය, ලක්සන්බර්ග් හා නෙදර්ලන්තය යුරෝපා ප්‍රජාව පිහිටුවිමට දායක වූ මූලික සාමාජිකයෝ වෙති. මෙම යුරෝපා ප්‍රජාව පිහිටුවිමේ මූලික අරමුණ වුයේ එම ප්‍රදේශය පුරා පැතිරී

තිබූ ගල් අඟුරු හා යකඩ කර්මාන්තය පාලනයක කිරීමට නියාමක අධිකාරියක් ඇති කිරීම සඳහා 1957 දී ඊට රෝමය එක් වූ අතර යුරෝපා ආර්ථික ප්‍රජාව හා පරමාණු ශක්ති කටයුතු ද මෙම ගිවිසුමට ඇතුළත් කරනු ලැබිණි. 1973 සිට 1995 කාලය තුළදි ඊට තවත් රටවල් ගණනාවක් එක්විය. මේ වන විට යුරෝපා ප්‍රජාවට රටවල් 15 ක් එකත්වි තිබේ. ඒ අතර බ්‍රිතාන්‍ය, ග්‍රීසිය, අයර්ලන්තය, ඩෙන්මාර්කය, ස්පාඤ්ඤ, පෘතුගාලය, ස්විඩනය, පින්ලන්තය, හා ඔස්ට්‍රියාව වෙයි. මේ වන විට යුරෝපා ප්‍රජාවේ ජනගහනය මිලියන 379 කි. 1992 අත්සන් කළ මාස් ස්ට්‍රිච් ගිවිසුම අනුව යුරෝපා ප්‍රජාව සිය කටයුතු තවත් අංශ ගණනාවකට ව්‍යාප්ත කලේය. සංස්කෘතිය, අධ්‍යාපනය, පාරිභෝගික ආරක්ෂාව පොදු මුදලක් සඳහා යුරෝපා ප්‍රජාව යොමු කිරීම මේ අතර වෙයි. ප්‍රංශය මෙම කටයුතු සිදු කිරිමේදි සිය ආර්ථික , සාමාජීය හා මූල්‍ය ඒකාබද්ධතා කටයුතු සිය සාමාජික රටවල යහපත සඳහා යෙදවීම අරමුණු කරගෙන කටයුතු කරයි. ප්‍රංශය ද මාස් ස්ට්‍රිච් ගිවිසුමට 1992 වසරේදි එක්විය. 2002 ජනවාරි පළවෙනිදා යුරෝපා නැමැති පොදු මූල්‍ය ඒකකය උපත ලැබීය. ඒ තුළින් යුරෝපා ප්‍රජාවට අයත් සාමාජික රටවල ශක්තිය වඩාත් තහවුරුවිය. යුරෝපය එකම වෙළඳපොලක් හා එකම ප්‍රජාවක් බවට මෙමගින් පත්වූ අතර වෙන් වෙන්ව තිබූ මූල්‍ය ඒකක අතර තිබූ අනුපාත මෙමගින් ඉවත් කෙරෙනු ලැබේ. මෙය වෙළඳ ආයෝජන හා සංචාරක හා කම්කරු යන ක්ෂේත්‍රවල පොදු දියුණුවට තදින්ම බලපෑවේය. මෙමගින් යුරෝපා ප්‍රජාව තුල ඒකීය දේශපාන හා ආර්ථික ශක්තියක් ප්‍රවර්ධනය කිරීමට හේතුවිය. වසර 2000 දි යුරෝපා ප්‍රජාවේ දළ දේශිය නිෂ්පාදිතය ඩොලර් බිලියන 10529 ක් විය. එය උ.තුරු ඇමරිකාවේ දළ දේශීය නිෂ්පාදනයට සමානවේ. ලෝක වෙළඳාමට යුරෝපා ප්‍රජාව කෘෂිකාර්මික නිෂ්පාදන ආයනයනය කිරිමේදි ප්‍රමුඛ පෙළේ සහායක් හිමිකර ගත්තේය. 1999 වසරේදි ලෝකයේ ධාන්‍ය අපනයනයෙන් සියයට 13.1 ක් යුරෝපා ප්‍රජාවෙන් සැපයිනි. ඔයිල් සීඩ්ස් අපනයනයේ සියයට 3.5 ක් වයින් අපනයනයෙන් සියයට 41.5 ක් යුරෝපා ප්‍රජාව හිමිකර ගත් අතර කිරි අපනයනයෙන් සියයට 20.2 ක් හිමිකර ගැනීමටද සමත් විය. ලෝකයේ

සැපයුමෙන් සියයට 31.9 ක් ලබා දුන්නේ යුරෝපා ප්‍රජාවයි. යුරෝපා ප්‍රජාවේ සාමාජිකයෙකු ලෙස ප්‍රංශය සිය කලාපයේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රධාන දායකත්වයක් සපයයි. යුරෝපා ප්‍රජාවේ සාමාජිකයන් සමග පැවැත්වූ වෙළඳ කටයුතු වලින් සියයට
63 ක්ම අත්කර ගත්තේ ප්‍රංශයයි. එමගින් කෘෂිකර්ම නිෂ්පාදනය වැඩි ප්‍රමාණයක් යුරෝපා ප්‍රජාවට දායාද කිරීමට ප්‍රංශය සමත්විය. ධාන්‍ය, සීනි, හා ඔයිල් සීඩ්ස් නිෂ්පාදනයේදී ප්‍රමුඛ ස්ථානයට පත්වඇත්තේ ප්‍රංශයයි. ජර්මනිය, ඉතාලිය, එක්සත් රාජධානිය, ස්පාඤ්ඤ, බෙල්ජියම හා ලක්සම්බර්ග් සමග ප්‍රංශය සිය වෙළඳ කටයුතු සිදු කරයි. දිගු කාලීනව ආර්ථික සංවර්ධනය සඳහා කටයුතු කරන ප්‍රංශය යුරෝපා කලාපය තුළ සෘජු ආයෝජන සඳහා දැඩි දායකත්වයක් දක්වයි. එමගින් අසල්වැසි රටවල් සමග දැඩි සම්බන්ධතාවයක් පැවැත්විටම ප්‍රංශයට හැකිවී තිබේ. MAPI , නොබිලිස්, ප්ලාස්ටික් ඔම්නියම් SA , කරේරෝපෝ වැනි සමාගම් ස්පාඤ්ඤය හා ස්ලෝවැකියාව තුළ සිය ආයෝජන සිදු කර ඇත. මේවා ප්‍රංශයේ ප්‍රධාන පෙළේ සමාගම් වෙයි. විශාල මුදලක් එම ස්ථානවල ආයෝජනය කර ඇති අතර එමගින් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිෂ්පාදන සිදු කිරීමට එම සමාගම් කටයුතු කර තිබේ.

ප්‍රංශය වර්ග කිලෝමීටර් 550,000 සමන්විතය. එරට තුළ ගොවිබිම් සංරක්ෂණ වනාන්තර , දර්ශනීය කඳු මුදුන් පිහිටා ඇති අතර කිලෝමීටර් 5500 ක් පුරා දර්ශනීය වෙරළ තීරයක් ද ඇත. පරිසරය රැකගැනීමට සුවිශේෂ අවධානයක්ද යොමු කර තිබේ. සංරක්ෂිත ප්‍රදේශ, ජාතික උද්‍යාන හා වෙරළතීර මේ යටතේ සංරක්ෂණය කිරීමට පියවර ගෙන තිබේ. ප්‍රංශයේ ජනගහණය මිලියන 60.2 කි. වසර 2003 දී ලබාගත් දත්ත අනුව, එහි ශ්‍රමබලකාය මිලියන 26.5 ක් විය. ජනතාව නාගරික ප්‍රදේශ 52 ක් පුරා පැතිර සිටී. කෙසේ වෙතත් පැරිසිය තුළ සිටින සංක්‍රමනිකයින්ගේ සංඛ්‍යාව මිලියන 2.1 කි. ප්‍රංශයේ දෙවන ප්‍රධාන නගරය වන ලියෝන් නගරය තුළ සංක්‍රමනිකයින් 1.2 ක් පදිංචි වී සිටිති. ප්‍රංශයේ ප්‍රධාන නාගරික ප්‍රදේශ 4 ක් තිබේ. පැරිසිය, ලියෝන්, මාසෙයි ලිල්, ටුලූස් යන නගර ඒ අතර වේ. ප්‍රංශය කළාප 22 කට බෙදා තිබේ. ඒ තුළ රාජ්‍ය ආයතන, විදේශීය

ආයතන රැසක් පිහිටා ඇති අතර පාර්ලිමේන්තු ක්‍රමය මගින් රට පාලනය වේ. පාර්ලිමේන්තුව තුළ ජාතික සභාවක් හා සෙනෙට් සභාවක් වේ. ප්‍රංශයේ බලධාරියා ජනාධිපතිවරයායි. රටෙහි විශේෂ බලතල භාවිතා කිරීම ඔහුට හිමිවී තිබේ. ආරක්ෂක බලතල හා හදිසි නීති පිළිබඳ ක්‍රියා කිරීම ඔහුට පැවරී ඇත. 2004 වසරේදී ප්‍රංශයේ අපේක්ෂිත දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රවර්ධනය සියයට 1.6 කි. ප්‍රංශය සිය විදේශීය සෘජු ආයෝජන සිදු කිරීම අඛණ්ඩව සිදු කෙරෙන අතර ඒ සඳහා විදේශීය රටවලින් දැඩි ඉල්ලුමක් පවතී. ලෝක වෙළඳ සංවිධානය හරහා බහුවිධ ගිවිසුම් සඳහා යොමු වී තිබේ. ජාත්‍යන්තර වෙළඳ සබඳතා නැංවීම මෙම ගිවිසුම්වල අරමුණයි. උදාහරණ වශයෙන් ප්‍රංශය සිංගප්පූරුවේ ඩොලර් බිලියන 3.9 ක සෘජු ආයෝජනයක් සිදුකර තිබේ. ආසියාකරේ දෙවන වෙළඳ කටයුතු පිළිබඳ සහායකයා ලෙස ප්‍රංශය කටයුතු කරයි. දැනට ජපානය ආසියාකරයේ ප්‍රධාන වෙළඳ කටයුතු මෙහෙයවන්නාවේ. 1999 වන විට යූරෝ බිලියන 35 ක විදේශීය ආයෝජන සිදු කර ඇති අතර. ජපානයේ ඩයිකින් කෙමිකල් සමාගමේ ප්‍රංශයේ ආයෝජනය කළ මුදල යූරෝ මිලියන 20 කි. එම සමාගමේ නිෂ්පාදන ඒකකයක් ප්‍රංශයේ ලියෝන් නගරයේ පිහිටුවීමට මෙම මුදල ආයෝජනය කෙරෙති. කෘෂිකර්මය, කර්මාන්ත, විද්‍යා හා තාක්ෂණය, සංචාරක, විලාසිතා වැනි ක්ෂේත්‍රවල ආයෝජනය කිරීමට සැදි පැහැදි සිටි. සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල මෙවැනි ආයෝජන කටයුතු සඳහා එක් පාර්ශවයක් ලෙස එක්වීමට ප්‍රංශය කටයුතු යොදා තිබේ.

<u>රෝන් ඇල්ප්ස් ප්‍රාන්තය.</u>

රෝන් සහ සැනෝවේ ගංගා අතර පිහිටි නිම්නයේ මෙම ප්‍රාන්තය පිහිටා ඇත. එහි වර්ග කිලෝමීටර් ප්‍රමාණය 43700 කි. කඳු, තැනිතලා හා වලගොඩැලි අතුළු මිශ්‍ර භූගෝලීය ලක්ෂණයන්ගෙන් ප්‍රාන්තය සමන් විත අතර අභ්‍යන්තර ජලමූලාශ්‍ර ප්‍රාන්තය තුළ පිහිටා

ඇත. ප්‍රාන්තයේ සුළු ජනගහනයෙන් මිලියන 5.5 කි. පාලනය පහසු කිරීම සඳහා ප්‍රාන්තය ඒකක 8 කට බෙදා තිබේ.

ඒවා නම්, එයින්, ආඩෙෂ්, ද්‍රෝම්, ඊසයර්, ලූවාරෝන්, සවුවා හා ඕට්සවුවා යන ප්‍රදේශයි. මෙම ප්‍රදේශ ප්‍රාදේශිය සභාවකින් හා ප්‍රාදේශීය ආර්ථික හා සාමාජීය සභාවකින් පාලනය කෙරේ. රෝන් ඈල්ප්ස් ප්‍රාන්තය තුළ ප්‍රධාන නගර තුනක් වෙයි. ලියෝන්, ග්‍රනෝබ්ල හා සෙන්ට්එට්යන්න එම නගර තුනයි.. ඉන් ප්‍රධාන නගරය ලියෝන් නගරය වන අතර ඒ තුළ මිලියන 1.2 කක ජනතාවක් ජීවත්වෙයි. ලියෝන් නගරය යුනෙස්කෝ සංවිධාන විසින් ලෝක උරුමයන්ගෙන් එකක් බවට පත් කර තිබේ. කලාව, සංස්කෘතිය හා අධ්‍යාපනය යන අංශ ඇත අතීතයේ සිටම එම නගරය තුළ පැවැති අතර ඉතා සුවිසල් දේවස්ථාන, විශ්ව විද්‍යාල ගොඩනැගිලි, වෙළඳපොලවල් හා භෝජනාගාරවලින් නගරය සමන්විතය. නගරය සතුව උසස් සංස්කෘතික උරුමයක් පවතී. ලියෝන් නගරය පාලනය සඳහා දිස්ත්‍රික්ක 9 කට බෙදා තිබේ. එම සෑම දිස්ත්‍රික්කයකම නගරාධිපතිවරයෙක් සහ නගරසභාවක් ඇති අතර එමගින් නගරයේ සැලසුම් කටයුතු මෙන්ම නාගරිකයන්ට පහසුකම් සැලසීම සිදු කෙරේ. කර්මාන්ත හා වෙළඳ මධ්‍යස්ථානයක් ලෙසද ලියෝන් නගරය  වැදගත් වේ. ඉතා සරුතැනිතලා ප්‍රදේශ හා නිම්න ප්‍රදේශ නගරයේ ඇති අතර නගරය වටා දර්ශනීය කඳු ගැටපෙලක් පවතී. මේවා තුළ ගොවි බිම් හා මිදි වතු පිහිටුවා තිබේ. ආහාර හා වයින් නිෂ්පාදනයේ ප්‍රමුඛයෙකු ලෙස ලියෝන් නගරය කටයුතු කරයි.. සෝන් හා රෝන් ගංගා නගරය හරහා ගලා බසින අතර මධ්‍යධරණී මුහුදේ සිට වෙළඳ ප්‍රවාහණ මාර්ගයක් එමගින් ඇතිවී තිබේ. මෙම ගංගා කේන්ද්‍ර කරගෙන ආර්ථික
සංවර්ධන කටයුතු මෙන්ම රැකියා ඇතිවී තිබේ. ප්‍රංශයේ දළ දේශීය නිෂ්පාදන වියදම සියයට 10 වඩා වැඩි දායකත්වයක් වාර්ෂිකව ලියෝන් නගරය ලබා දේ. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හා සමාගම් ප්‍රවර්ධනය කිරීමට ප්‍රාදේශීය පරිපාලනය සහාය වේ. එමෙන්ම, නවීන තාක්ෂණය යොදාගෙන ඵලදායීතාව වැඩිකර ගැනීම සඳහාද එම පරිපාලනය මහ පරිමාණයේ සමාගම්වලට උපකාර කරයි. භූගෝලීය වශයෙන් වඩා උසස් යටිතල පහසුකම්වලින් සමන්විත ලියෝන් නගරය තුළ ව්‍යාපාර කටයුතු සඳහා හොඳ

පරිසරයක් තිබේ. විනෝදාශ්වාදය සඳහා විවිධ පහසුකම් රෝන් ඇල්ප්ස් ප්‍රාන්තය තුල පිහිටා තිබේ. සංචාරක කර්මාන්ත දියුණුවට එය දැඩි ලෙස බලපා තිබේ. කඳුමුදුන් ගණනාවක් ආශ්‍රිතව මෙම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සිදු කෙරෙන අතර බටහිර යුරෝපයේ ඇති සාර්ථකම වයින් නිෂ්පාදන ප්‍රාන්තය ලෙසද රොන් ඇල්ප්ස් ප්‍රාන්තය ජනප්‍රියය. වෙළඳ හා කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා පරිපාලන ආයතන මෙන්ම නියාමන ආයතන පිහිටුවා තිබේ. දේශීය ව්‍යාපාරවලට අභ්‍යන්තර අවධානය එමගින් යොමු කෙරේ. සුළු හා මධ්‍යපරිමාන ව්‍යවසායිකයින් පිළිබඳ සම්මේලනය මේ සඳහා ආධාර කරයි. එම ආයතනයේ 8000 ක් පමණ සාමාජිකයින් සිටී. ඕනෑම ආකාරයක ව්‍යාපාර කටයුත්තක් සඳහා ප්‍රදර්ශන, බැංකු, නීති කටයුතු මෙන්ම රාජ්‍ය ආයතන සඳහා ආයතනය නියෝජනය කිරීමට එහි සෑම සාමාජිකයෙකුටම හැකියාව ඇත. එම ආයතනය ඉහළ කළමණාකාරිත්ව සඳහා පුහුණු පාඨමාලා පවත්වයි. ජාත්‍යන්තර ව්‍යාපාර කටයුතු සඳහා දූත මණ්ඩල මෙහෙයවීමද මෙම ආයතනය සිදු කරනු ලබයි. අවම වශයෙන් එක් සුළු හා මධ්‍යපරිමාණ කර්මාන්තයක් තුලින් වාර්ෂිකව යුරෝ මිලියන උපදවා ගන්නා අතර එවැනි සමාගමක සේවකයින් 30 සිට 500 දක්වා ප්‍රමාණයක් සේවය කරනු ලබයි. සුළු මධ්‍යපරිමාණ කර්මාන්ත පිළිබඳව සම්මේලනය සමාගම්වල විවිධ සේවා කටයුතු සහ සුවිශේෂ කර්තව්‍යයන් සඳහා සහාය සපයයි. ආපනයන සඳහා සමීපව සමාගම් සමග කටයුතු කරන මෙම ආයතනය ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ප්‍රධාන පෙළේ කාර්යභාරයක් ඉටුකරයි. ප්‍රංශයේ ප්‍රාන්ත 4 ක වාර්ෂිකව ප්‍රදර්ශන හා වෙළඳපලවල් සංවිධානය කරන එම ආයතන මාසිකව සිය කටයුතු පිළිබඳව තොරතුරු සපයන සඟරාවක්ද පලකරන්නේ සිය වෙබ් අඩවියට අමතරවයි. වසර 13 ක වෘත්තිය පලපුරුද්දක් එම ආයතනයට තිබේ. එහි එක් අංගයක් වන්නේ ක්ලාස් එක්ස්පෝර්ට් ආයතනය මේ වන විට එවැනි වෙළඳ සල්පිල් සඳහා සමාගම් 2000 ක් පමණ සම්බන්ධ කර ගැනීමට සමත් වී ඇත. ආනයන හා අපනයන වෙළදාම තහවුරුකිරීම මෙන්ම ව්‍යාප්ත කිරීම කටයුතු කරන ක්ලාස් ආයතනය ආයෝජකයින් හඳුනාගැනිම ද කටයුතු කරමින් සිටී. තම සාමාජිකයින් මෙන්ම සම්බන්ධිත ආයතන සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම වෙනත් සමාගම්වලට පහසුකම් සළසන්නෙක්

ලෙසද එය කටයුතු කරයි. වෙළඳ සම්මේලනය හා ක්ලාස් යන ආයතන රෝන් ඇල්ප්ස් ප්‍රාන්තයේ කර්මාන්ත අංශයේ ප්‍රමුඛස්ථානය හිමිකර ගෙන තිබේ.

## ශ්‍රී ලංකාව, මාලදිවයින, දකුණු ඉන්දීය ආයෝජන සඳහා වඩාත් සුදුසුයි..

ශ්‍රී ලංකාව, මාලදිවයින හා දකුණු ආසියාව සඳහා ආයෝජනය හා වෙළඳ කටයුතු වෙනුවෙන් රෝන් ඇල්ප්ස් ප්‍රාන්තය වැඩි පහසුකම් සලසා තිබේ. කෙසේ වෙතත් ප්‍රංශ භාෂාව පිළිබඳ ඇති බාධක ඉවත් කිරීමට මේ වන විට **ඉන්වෙස්ටර් සර්විසස් ඒෂියා** ආයතනය පිහිටුවා තිබේ. මේ වන විට ප්‍රංශය පිළිබඳ සියලු තොරතුර නව ආයෝජකයින් සැපයීම සිදු කරනු ලබන අතර රෝන් ඇල්ප්ස් ප්‍රාන්තයේ සුළු හා මධ්‍යපරිමාණයේ වෙළඳ සම්මේලන මෙන්ම ක්ලාස් එක්ස්පෝර්ට් ආයතනය සමග මනා අන්තර් සම්බන්ධතාවක්ද පවත්වනු ලබයි. එමෙන්ම. ඉන්දීය වෙළඳ සමාගම් සමග මනා සම්බන්ධතාවක් පවත්වාගැනීමටද එම ආයතන සමත් වී තිබේ. ඉන්වෙස්ටර් සර්විසස් ඒෂියා සමාගම මගින් ,

01. කාර්මික ව්‍යාපාරිකයින් සඳහා ගනුදෙනුකරුවන් හඳුන්වාදීම.

02. මෙවැනි කටයුතු සඳහා පූර්ව සාකච්ඡා සහ පසු සාකච්ඡා සංවිධානය කිරීම.

03. එක් එක් ව්‍යාපෘතිය සඳහා අදාල ආයෝජකයින් හා ගණුදෙනුකරුවන්ගේ ගමන් පහසුකම් සම්බන්ධීකරණය කිරිම.

04. වෙළඳපල , කර්මාන්ත, ව්‍යාපාර හා නීතිරීති පිළිබඳවද සියලු තොරතුරු සැපයීම.

05. වෙළඳ ප්‍රදර්ශන සහ ව්‍යාපාරික සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.

දේශීය සමාගම් සඳහා පහසුකම්ද මෙම ආයතනය සපයනු ලබයි. ආනයන අපනයන කටයුතු සඳහා කර්මාන්තකරුවන් , ව්‍යාපාරිකයින්, සම්බන්ධ කිරීම සිදුකෙරේ.

එමෙන්ම, ඒකාබද්ධ ආයෝජන සඳහා ආයෝජකයින් හඳුනා ගැනීම, සෘජු හා වක්‍ර ආයෝජනය සඳහා ඔවුන් යොමු කිරීම. තාක්ෂණික විශේෂඥසේවා සැපයීම, නිෂ්පාදන බෙදාහැරීම මෙන්ම, අලෙවි කටයුතු සිදු කිරීමද මෙම ආයතනය මගින් සිදුකෙරේ. මෙරට තේ , ඇගලුම්, මැණික්, මුද්‍රණ කටයුතු, පෝසිලේන් නිෂ්පාදන සඳහා දැනටමත් ජාත්‍යන්තර වෙළඳපොළ හඳුනාගැනීමට මෙම ආයතනය කටයුතු කර ඇත. එමෙන්ම, මැණික් , මුද්‍රණ කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර ආනයනය කිරීම සඳහාද අවශ්‍ය ආයතන හඳුනාගෙන තිබේ. මාලදිවයින දකුණු ඉන්දියාව වැනි රටවල් සඳහාද ආනයන අපනයන අවස්ථාවන් ඉන්වෙස්ටර් සර්විසස් ආයතනය හඳුනාගෙන ඇති අතර ඒවා පහත සඳහන් වගුව මගින් දක්වා ඇත.

## සංචාරක කර්මාන්තය.

මාලදිවයින හා ශ්‍රී ලංකාව තුළ සංචාරක කර්මාන්තය සඳහා අවශ්‍ය පහසුකම් රැසක් පවතී. දේපළ සංවර්ධන, අලෙවි කටයුතු හා ප්‍රවර්ධන ආයතන, යන්ත්‍ර සඳහා ආයෝජනය, හෝටල් හා සංචාරක ක්ෂේත්‍රය සඳහා මනා පළපුරුද්දක් ලත් සේවකයින් සැපයීම ඉන්වෙස්ටර් සර්විසස් සමාගම මගින් සිදු කිරීමට කටයුතු යොදා තිබේ. එම සමාගම මගින් මේ සඳහා ආයෝජකයින් ප්‍රධාන පෙළේ සමාගම් හිමියන් සංචාරක සේවා සපයන්නන් හඳුනාගෙන ඇති අතර ප්‍රංශය හා ශ්‍රී ලංකාව අතර වෙළඳ සබඳතා නැංවීමට මෙය දැඩි ලෙස ඉවහල් වේ. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව උසස් තත්ත්වයෙන්, කඩිනමින් අදාල කටයුතු සිදු කිරීමට මෙමගින් සේවා සැපයේ. මීට අමතරව ප්‍රංශයේ හා යුරෝපා ප්‍රජාවේ වෙළඳ කටයුතු පිළිබඳ නීතිරීති අනුව, කටයුතු කිරීමට ආයෝජකයින් යොමු කිරීම හා ඔවුන්ට උදව්කිරීම ඉන්වෙස්ටර් සර්විසස් ආයතනය සිදුකරනු ලබයි.

## ප්‍රංශයේ වෙළඳ කටයුතු පිළිබඳ සාමාන්‍ය නීතිරීති.

01. ප්‍රංශයට ආනයනය කෙරෙන අමුද්‍රව්‍ය සඳහා බොහෝවිට තීරුබදු අය කෙරෙන්නේ නැති අතර ඇතැම් අමුද්‍රව්‍යවලට අඩු තීරුබදු ගාස්තුවක් අයකෙරේ.

02. කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා ප්‍රංශය යුරෝපා ප්‍රජාවේ ප්‍රමිතින් දැඩි ලෙස අනුගමනය කරනු ලබයි.

03. ප්‍රංශයට ආනයනය කෙරෙන නිෂ්පාදන සඳහා සියයට 5 ත් සියයට 17 ත් අතර තීරුබද්දක් අයකෙරේ.

04. විදේශියන්හී සකසන ලද නිෂ්පාදන ප්‍රංශයට ගෙනඒමේදී ආනයන බද්දක් පැනවේ.

05. ආනයනය කරන භාණ්ඩ මත සියයට 19.6 ක වැට් බද්දක් පැනවේ. නැතහොත් කෘෂිකර්ම නිෂ්පාදන, ආහාර හා තෝරාගත් ඖෂධ සඳහා සියයට 5.5 ක බද්දක් පැනවේ.

06. ආනයන හෝ අපනයන ගණුදෙනුවේ වටිනාකම යුරෝ 12500 ඉක්මවන විට එය අනුමත බැංකුවක් හරහා සිදු කළ යුතුවේ.

07. ආනයන අපනයන කටයුතු සිදු කිරීමේදී පිළිගත හැකි ලිපි හා ලියකියවිලි ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ. ( ඉන් වොයිස් , වෙළඳ අනකර, ගුවන් සේවා, බිල්පත් වැනි ලියවිලි.)

08. වානිජ ඉන් වොයිස් පත්‍රයක පහත සඳහන් තොරතුරු අඩංගු විය යුතුය. විශේෂයෙන් ඉංග්‍රිසි හා ප්‍රංශ භාෂාවන්ගෙන් ඒවා සඳහන් විය යුතු වේ.

- අලෙවිකරන්නාගේ සහ අතරමැදියාගේ නම හා ලිපිනය.
- ඉන්වොයිස් පත්‍රය නිකුත් කළ දිනය හා ස්ථානය.
- නැව්ගත කරන ආකාරය.
- අදාල ඇසුරුම්වල සඳහන් අංක අනුපිළිවෙළ.
- අදාල භාණ්ඩවල තොරතුරු - වර්ගය, තත්ත්වය, ශ්‍රේණිය, අගය වැඩිකල නිෂ්පාදන නම් ඒවා පිළිබඳ තොරතුරු.

- භාණ්ඩ ප්‍රමාණය.
- ගිවිසගත් මිළ - ඒකකයක වටිනාකම, මුළු වටිනාකම, රක්‍ෂණ හා කන්ටේනර් මෙහෙයුම් ගාස්තු.
- ප්‍රවාහණ කිරීම හා ගෙවීමේ කොන්දේසි.
- අපනයනය කරන සමාගමේ බලධාරී පුද්ගලයාගේ අත්සන.

මෙවැනි අංශ පිළිබඳ ඉන්වෙස්ටර් සර්විසස් ඒෂියා ආයතනය වෘත්තීය තොරතුරු සපයයි. ඒ අනුව, විශ්වාසයෙන් යුක්තව සාර්ථක අයුරින් ප්‍රංශ වෙළඳපොලට පිවිසීම අපනයනකරුවන්ට අවස්ථාව සැලසේ.

මේ අනුව, බලන කළ සෑම අතින්ම පොහොසත් ප්‍රංශය මෙන්ම. රෝන් ඇල්ප්ස් ප්‍රාන්තය තුළ සුවිශේෂ ව්‍යාපාරික අවස්ථා ඇත. ඉන්දීය අර්ධද්වීපයේ සමාගම් ප්‍රංශය තුළට පිවිසීම අපේක්‍ෂා කරන්නේ නම් ඉන්වෙස්ටර් සර්විසස් ඒෂියා ආයතනය ඒ පිළිබඳ සියලු තොරතුරු සැපයීමට බැඳී සිටී. කළාපීය වෙළඳාම තහවුරු කිරීම හා සංවර්ධනය කිරීම ඉන්දීය අර්ධද්වීපයේ පිහිටි සියලු සමාගම්වලට අප උපකාර කරන්නෙමු.

ශ්‍රී ලංකාවේ කොළඹ 1, ලෝටස් පාරේ, අංක 64 හි පිහිටි ගලධාරී හෝටලයේ පළමු මහලේ 128 වැනි කාමරයට පැමිණෙන්නේ නම් අවශ්‍ය සියළු තොරතුරු ලබා ගත හැකිය.

අපේ දුරකථන අංකය : 941239300 න් තොරතුරු ලබාගත හැකිය.

අපේ වෙබ් අඩවිය : www.is-asia.net

අපේ ඊමේල් : admin@is-asia.net